නිපුණතාව 9 - විදේශ වෙළෙඳාමේ න්‍යායාත්මක පදනම විග්‍රහ කරමින් විදේශ වෙළෙඳාම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ඇති කරන බලපෑම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 9.1 - අන්තර්ජාතික වෙළෙඳාමට පදනම් වූ සාධක විමර්ශනය කරයි.

9.2 - ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග හා එමගින් නිදහස් වෙළෙඳාමට ඇති කරන බලපෑම විශ්ලේෂණය කරයි.

1. ජාත්‍යන්තර වෙළෙඳාමට පදනම් වන ස්ථිතික හා ගතික සාපේක්ෂ වාසි යනුවෙන් කුමක් අදහස් වේ දැයි දක්වා ඊට පදනම් වන සාධක දක්වන්න.
2. (අ) ශ්‍රී ලංකාව සම්බන්ධ වී සිටින ද්වී පාර්ශවීය වෙළෙඳ ගිවිසුම්වල භාවිතය තුළ ඉන්දු-ශ්‍රී ලංකා සහ පාකිස්ථාන-ශ්‍රී ලංකා ගිවිසුම්වල බලපෑම පැහැදිලි කරන්න.
   (ආ) මෑත වර්ෂවල ගෝලීය වෙළෙඳාම තුළ ශ්‍රී ලංකාවට වැදගත් වන විකල්ප වෙළෙඳ ගිවිසුම් මොනවාද?
3. අධි තක්සේරු වූ විනිමය අනුපාතිකයක් පැවතීම හෝ පවත්වා ගෙන යාමක අවාසි මොනවාද?
4. විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීම හෝ ක්ෂය වීමට ඉඩ සැලසීම වෙළෙඳ ශේෂය කෙරෙහි යහපත් බලපෑමක් ඇති වේ යැයි සැලකුවද එම තත්ත්වය තීරණය වීම කෙරේ බලපාන ආර්ථික සාධක කවරේද?
5. ශ්‍රී ලංකාවේ විදේශ විනිමය වෙළෙඳපොලේ ද්‍රවශීලතා තත්ත්වය පහත හෙළමින් ආයෝජන කළඹ මත පීඩනය ඉහළ යාමට තුඩු දුන් සාධක කවරේද?